**මදුරාවල ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
**----------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 25 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 21 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූනි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මදුරාවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂයේදී සභාවට ලැබී තිබූ රු.4,000,000 ක් සහ එහි වියදම් ආදායම් හා වියදම් ලෙස ගිණුම් ගත නොකර විවිධ තැන්පත් ගිණුමේ තැන්පත් කර ඉන් වියදම දරා තිබුණි.

(ආ) ඉන්වෙන්ට්‍රි අයිතම යටතට ගැනෙන රු.389,863 ක් වූ භාණ්ඩ , තොග ශේෂයට ඇතුළත් කර දැක්වීම නිසා එම ප්‍රමාණයෙන් තොග ශේෂය හා වර්ෂයේ අතිරික්තය වැඩියෙන් දැක්වුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට කොම්පෝස්ට් අංගනයේ පැවති රු.48,000 ක් වූ පොහොර පැකට් තොගයද,සභාවේ උප කාර්යාලවල පැවති ඉතිරි තොගයද හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබූ අතර ආදාහනාගාරයට මිලදී ගෙන තිබූ රු.18,267 ක් වූ ගෑස් සහිත සිලින්ඩර් 03 ක්ද තොග ශේෂයට ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව මෝටර් රථ හා කරත්ත,යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ කර්මාන්ත ණය ගැති ශේෂ පිළිවෙළින් රු.17,838,432 ක් , රු.2,853,258 ක් හා රු.3,497,958 ක් වුවද ඒවාට අදාළ උපයෝගී ලේඛනවල එකතුව පිළිවෙළින් රු.15,217,890 ක්,රු.1,574,952 ක් සහ රු.1,900,251 ක් විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,804,723 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.3,192,306 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන ඌණතා /අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වරකාගොඩ උපකාර්යාලයේ රැස් කිරීමේ ගිණුමේ (ජංගම ගිණුමේ) ශේෂය වූ රු.247,455 ක් මාස 03 ට අධික කාලයක් කිසිදු උපයෝජනයකින් තොරව ශේෂව පැවතුණි.

(ආ) සේවක ණය ශේෂය තුළ අය වීම් සිදු නොවන රු.90,003 ක ණය ශේෂයක් විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000' | රු.000' | රු.000' |
| වරිපනම් හා බදු | 1,175 | 891 | 973 |
| බදු කුලී | - | - | - |
| බලපත්‍ර ගාස්තු | 240 | 175 | - |
| වෙනත් ආදායම් | 506 | 1,000 | - |

2.3.2 වරිපනම් බදු

2014 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති රු.766,828 ක් වූ වරිපනම් බදු ශේෂයෙන් රු.427,648 ක්ද, රු.87,590 ක් වූ අක්කර බදු ශේෂයෙන් රු.1,863 ක්ද 2015 ජූනි 20 වන විට අය වීමට තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 ඌණ උපයෝජිත වත්කම්

------------------------------

කොන්ක්‍රීට් කණු නිෂ්පාදන ව්‍යාපෘතිය යටතේ 2012 හා 2013 වර්ෂවල නිෂ්පාදනය කර තිබූ කොන්ක්‍රීට් කණු 200 න් විගණිත දිනය වන විටත් භාවිතා කර තිබුණේ කණු 36 ක් පමණි.රු.74,383 ක් වටිනා ඉතිරි කණු 164 ම කිසිදු භාවිතයකින් තොරව පැවතුණි.

3.2 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

(අ) රු.109,702 ක පිරිවැයක් දරා සභාව සඳහා වාහන සේවා ස්ථානයක් (සර්විස් අංගනයක්) ඉදි කර 2013 ජූනි 10 දින වැඩ අවසන් කර තිබුණද එය සභාවේ වාහන සේවා කිරීම සඳහා භාවිත කර නොතිබුණි.සභාවේ සියලුම වාහන මුදල් ගෙවා බාහිර ආයතනයන්ගෙන් සේවා කරවාගෙන තිබූ අතර පහසුවෙන් සේවා කළ හැකි සභාවේ ත්‍රී රෝද රථ පවා බාහිර ආයතනවලින් සේවා කරවාගෙන මාස 05 ක් තුළ අවස්ථා 06 කදී රු.18,500 ක් ගෙවා තිබුණි.

(ආ) පළාත් නැගුම වැඩසටහන යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් අනුමත වී තිබූ රු.මිලියන 15 ක ප්‍රතිපාදන යටතේ සැලසුම් කර තිබූ ආදාහනාගාරය ඉදි කිරීම සඳහා පස් පරීක්ෂණ ගාස්තු වශයෙන් රු.60,000 ක් ගෙවා ඉදිකිරීම පසුව අත් හැර දමා තිබුණි.

(ඇ) මග නැගුම ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ අනුමත වී තිබූ ව්‍යාපෘති සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම සඳහා පුවත්පත් දැන්වීම් පළ කිරීම වෙනුවෙන් 2013 වර්ෂයේදී රු.19,706 ක් වැය කර තිබුණද එම ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) පුස්තකාල ග්‍රන්ථ පරිගණක ගත කිරීමේ මෘදුකාංගයක් සැපයීමට සහ උපදේශක ගාස්තු සඳහා 2014 ජූනි 09 දින රු.10,000 ක් ගෙවා තිබුණද විගණිත දිනය වූ 2015 මැයි 06 වන විටත් එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

3.3 මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------------------

(අ) ඉඩම් වෙන්දේසි කිරීම

--------------------------

1987 අංකත 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය අනුව සභා බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීමේදී වෙන්දේසි කරනු ලබන ඉඩම්වල විකුණුම් මිලෙන් සියයට 1 ක ආදායමක් සභාව විසින් ලබා ගත යුතු වුවත් එසේ සිදු නොකර සභාවේ ආදායම් පරිපාලක විසින් සකස් කර තිබූ දළ ඇස්තමේන්තුවෙන් සියයට 1 ක් වශයෙන් රු.1,011,977 ක් ඉඩම් විකිණීම් 03 කින් 2014 හා 2015 වර්ෂවලදී ලබා ගෙන තිබූ අතර දළ ඇස්තමේන්තුව හා වෙළඳපොළ විකුණුම් වටිනාකම අතර වෙනස ගලපා ඉතිරි මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පරිසර බලපත්‍ර නිකුත් කිරීම

--------------------------------

2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත මධ්‍යම පරිසර අධිකාරිය මගින් පළාත් පාලන ආයතනවලට බලතල පවරා දීම හා බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් මාලාවේ දක්වා ඇති පරිදි පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාපටිපාටිය

ප්‍රකාරව පරිසර බලපත්‍ර නිකුත් කළ යුතු වුවත් සභා බල ප්‍රදේශය තුළ පරිසර බලපත්‍ර ලබා ගත යුතු යැයි සභාව විසින් හඳුනාගෙන ඇති ආයතන 42 කින් විගණිත දිනය වූ 2015 මාර්තු 31 වන විට පරිසර ලබපත්‍ර ලබා දී තිබුණේ ආයතන 19 කට පමණි.ඒ අනුව කර්මාන්ත 23 ක් පරිසර බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ක්‍රියාත්මක වී තිබුණි.

(ඈ) සැලසුම් කමිටු ක්‍රියාත්මක නොවීම

---------------------------------------

සභා බල ප්‍රදේශයට අයත් බිම් කට්ටි සැලසුම් අනුමත කිරීමට හා ගොඩනැගිලි අයදුම්පත් අනුමත කිරීම සඳහා සැලසුම් කමිටුවක් ක්‍රියාත්මක කර නොතිබූ අතර 2014 වර්ෂය තුළදී පමණක් බිම්කට්ටි සැලසුම් 246 ක් හා ගොඩනැගිලි අයදුම්පත්‍ර 112 ක් කමිටු අනුමැතියකින් තොරව කාර්මික නිලධාරි නිර්දේශය මත පමණක් සභාපතිවරයා විසින් අනුමත කර තිබුණි.

(ඇ) කොම්පෝස්ට් නිෂ්පාදනය

------------------------------

2015 අප්‍රේල් 30 දින කොම්පෝස්ට් අංගනය පරීක්ෂාවේදී එහි ඇසුරුම් කිරීමට සූදානම් කර තිබූ පොහොර තොගයක්ද,ඇසුරුම් කරන ලද කිලෝග්‍රෑම් 25 මලු 08 ක්ද, කිලෝග්‍රෑම් 05 මලු 28 ක්ද, කිලෝග්‍රෑම් 02 මලු 05 ක්ද තිබුණි.මෙ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොම්පෝස්ට් අංගනයේ නිෂ්පාදනය කර ඇසුරුම් කරන ලද තොග හා නිකුත් කිරීම් සම්බන්ධයෙන් තොග පොත් පවත්වා නොතිබුණි.

(ii) අලෙවිය සඳහා උප කාර්යාලවලට ලැබී තිබූ කොම්පෝස්ට් මලු තොග පොතක සටහන් කර තිබුණද තොග ලැබීම්,නිකුත් කිරීම් නිවැරදිව සටහන් නොකිරීම නිසා තොග පොතේ සෘණ ශේෂ පැවති අවස්ථා විය.

(ඉ) වාහන අලුත්වැඩියා කිරීම

------------------------------

යම් කාර්යයක් සඳහා දෙනු ලබන අත්තිකාරම් මුදල ඇස්තමේන්තුගත වියදමින් සියයට 20 ක් නොඉක්මවිය යුතු වුවත් අවස්ථා තුනකදී JCB යන්ත්‍රයේ රු.248,472 ක් වූ ඇස්තමේන්තුගත අලුත්වැඩියා වියදමින් රු.186,549 ක් හෙවත් සියයට 75 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.

(ඊ) අයවැය පාලනය

--------------------

(i) වාර්ෂික අයවැය ලේඛනය මගින් ප්‍රාග්ධන වැය ශීර්ෂ 09 ක් හා පුනරාවර්තන වැය ශීර්ෂ 09 ක් සඳහා පිළිවෙලින් රු.50,401,500 ක් හා රු.27,000 ක් ප්‍රතිපාදන වෙන් කර තිබුණද ඉන් කිසිදු මුදලක් වැය කර නොතිබුණි.

(ii) එකතුව රු.28,192,100 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ වැය විෂයයන් 37 කින් රු.5,461,500 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමෙන් පසුද තව දුරටත් එම වැය විෂයයන්හි රු.612,844 ක් ඉතිරිව තිබුණි.

(iii) 2014 වර්ෂය සඳහා මාර්ග තලනය, JCB යන්ත්‍රය හා වතුර මෝටරය කුලියට දීමෙන් රු.මි.13 ක ආදායමක් ඉපයීම සඳහා ඇස්තමේන්තු කර තිබුණද,සමාලෝචිත වර්ෂයේ ඒවායින් උපයා තිබූ ආදායම රු.512,335 ක් පමණක් වීම නිසා රු.12,487,665 ක අධි ඇස්තමේන්තුවක් කර තිබුණි.

(iv) 2014 වර්ෂය සඳහා JCB යන්ත්‍රයේ ආදායම රු.421,000 ක් වූ අතර යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා රු.678,561 ක්ද,මීටර් පැය 550.35 ක් සඳහා ඉන්ධන වියදම රු.558,052 ක්ද වැය කර තිබීමෙන් ආදායම ඉක්මවා වියදමක් දරා ඇති බව නිරීක්ෂණය විය.

(v) 2014 වර්ෂයේ අයවැය ලේඛනය අනුව ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු වශයෙන් රු.440,000 ක්ද,වෙළඳ බලපත්‍ර ගාස්තු වශයෙන් රු.350,000 ක්ද ඇස්තමේන්තු කර තිබුණද අවසන් ගිණුම් සඳහා ඇස්තමේන්තුගත ආදායම ලෙස පිළිවෙළින් රු.367,000 ක් ද, රු.250,000 ක්ද දක්වා තිබුණි.

(උ) හානි හා පාඩු

----------------

වරකාගොඩ මහජන පුස්තකාලයේ 2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වූ පොත් 1063 ක ඌණතාවය සම්බන්ධයෙන් වගකිවයුත්තන් නිශ්චය කිරීම සඳහා සභාව මෙතෙක් කටයුතු කර නොතිබුණි.

3.4 කාර්ය සාධනය

------------------

වරාය හා මහා මාර්ග අමාත්‍යාංශයේ මග නැගුම ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ සභා බල ප්‍රදේශයේ මාර්ග 102 ක කොන්ක්‍රීට් ගල් ඇතිරීම සඳහා අනුමත කර තිබූ රුපියල් මිලියන 51.6 ක් වූ ප්‍රතිපාදනද,2014 වර්ෂයේ එක් මාර්ගයක් වෙනුවෙන් අනුමත කර තිබූ රු.250,000 ක්ද අදාළ කර්මාන්ත ඉටු නොකිරීම නිසා අවලංගු කර තිබුණි.

4. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) තොග පාලනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය